කලාපය 2 - 2006 ජනවාරි

# FLICT

## කතුවැකිය





තිරසාර සාමයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමට නම්, එයට කැපවුණු, සියළු පාර්ශවකරුවන්ගේ මූලිකත්වයෙන් සමන්විත, පුළුල් වුත්, ඵලදායී වුත් පියවර ඉදිරියට තැබිය යුතු බව අපගේ බලාපොරොත්තුවයි. සියළු අදාළ පාර්ශවකරුවන් මේ සඳහා ඉතා උද්යෝගයෙන් කටයුතු කරනු ඇතැයි අපි විශ්වාස කරමු. මේ දක්වා සාමය හඳුන්වාදීම තුළින් අප ලබා ඇති ප්‍රතිලාභ යහපාලනයක් සඳහා ඒකරාශී කර, එමඟින් ශ්‍රී ලංකාවේ සියළුම පුරවැසියනට සහජීවනයෙන් හා යුක්ති ගරුක ලෙස කටයුතු කිරීමට අවශ්‍ය පසුබිම සැකසීමට අපි නිරන්තරයෙන් වෙර දරමු.

FLICT (ගැටුම් පරිවර්තන දේශීය ආරම්භනයට පහසුකරණය) කණ්ඩායම අපගේ දෙවන පුවත් හසුන ඉදිරිපත් කරන්නේ ඉතා සතුටිනි. නව වසරක උදාව සමඟ සාමය පිළිබඳ ජනතාවගේ සුබවාදී අපේක්ෂා එළි දැක් වී තිබේ. අපගේ පාඨකයන් වෙතින් අප වෙත බොහෝ ඵලදායී අදහස් ලැබී ඇති අතර, මේ අදහස් උපකාරයෙන් අප මෙම සඟරාවේ අන්තර්ගතයද බෙහෙවින් වෙනස් කිරීමට යෙදුණි. ඔබගේ එම යෝජනාවනට අප බොහෝ ස්තුතිවන්ත වෙමු.

බොහෝ සංවිධාන, කණ්ඩායම් සහ පුද්ගලයෝ සටන් විරාම ගිවිසුම නිසා ලබා ඇති ප්‍රගතිය සාර්ථක කිරීම සඳහා වෙහෙස වෙමින්, ශ්‍රී ලංකාව තුළ දිගු කාලීනව පවතින අර්බුදයට තිරසාර විසඳුමක් ලබා දීම සඳහා සිවිල් සමාජය ශක්තිමත් කිරීමේ සාමුහික ප්‍රයත්නයක යෙදිසිටිති.

මෙම කටයුතු ආත්ම විමර්ශනයෙන් යුතුව සහ විනිවිද භාවයෙන් යුතුව කළ යුතුය යන්න අපගේ විශ්වාසයයි. එම නිසා තොරතුරු හුවමාරුවේදිත්, ශක්තිමත් දැනුවත් වීමේ පදනමක් ගොඩ නැඟීමේදිත්, විධිමත් න්‍යායාත්මක දැනුම සහ වෘත්තිමය විශේෂඥතාවන් මත කටයුතු කිරීම කළ යුතු වේ. ඒ අනුව ඔබ සමඟ අදහස් බෙදා ගැනීමේදිත් තොරතුරු ලබා ගැනීමේදිත් FLICT ව්‍යාපෘතියට මෙම පුවත් හසුන ඵලදායී මෙවලමක් වනු ඇත යන්න අපගේ විශ්වාසයයි.

අප ව්‍යාපෘතියෙහි ඉදිරි කටයුතු සඳහා සංශෝධිත ඉලක්කගත ක්ෂේත්‍ර තුනක් හඳුනා ගෙන ඇත. පාඨක ඔබගේ අදහස් අපගේ දීර්ඝ කාලීන ඉලක්ක සහ දර්ශනයන් සංශෝධනයේදී සලකා බලන ලදි. සංශෝධන සහිත අපගේ ඉලක්ක ක්ෂේත්‍ර තුන පැහැදිලි කරන නව සංකල්ප පිළිබඳ ප්‍රකාශනයක් සැකසෙමින් පවතී. සංකල්ප සංවර්ධනය සහ පර්යේෂණ සඳහා අපහට විශේෂඥ සහාය ලබා දුන් ආචාර්ය සුනිල් සිරිවර්ධන, ආචාර්ය බෙනඩික්ට් කෝර්ෆ් සහ මහාචාර්ය ට්‍රේසි ලෙයිටන් වෙත අපගේ ස්තුතිය පිරිනමමු.

අපගේ ඒකාබද්ධ ව්‍යාපෘති මඟින් ලබා ගත් දැනුම ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, ඉන් සමහරක් මෙම පුවත් හසුනට ඇතුළත් කර ඇත. එසේම ඉදිරියේදී එම තොරතුරු, ප්‍රකාශන මාලාවක් ලෙසින් ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු. එවන් තොරතුරු අන් අය සමඟ බෙදා හදා ගැනීම සඳහා අප වෙත යොමු කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු. සාර්ථක පර්යේෂණයන් මඟින් අපගේ හා ඒ හා සමගාමීව කටයුතු කරන නව ආයතන සහ ව්‍යාපෘති සමඟ එකතුව දැනුම ගොඩ නැඟීමටද අපේක්ෂා කරමු. ඒ අනුව ලබා ගත් දැනුම හුවමාරු කර ගැනීමේදී, මූලික පියවරක් වන අතර, එම දැනුම පදනම් කර ගෙන, ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ලබා ගැනීම ව්‍යාපෘතිය මඟින් සලකා බලනු ලැබේ.

මෙකී ජයග්‍රහණ සමඟින් ව්‍යාපෘතිය එවන් සංවිධාන සමඟ ශ්‍රී ලංකාව තුළ සියළු දෙනාටම සාමකාමීව සහ සාධාරණත්වයෙන් යුක්තව ජීවත් විය හැකි සමාජයක් ගොඩනැඟීම සඳහා වඩාත් සාර්ථක ඵලදායී පියවර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

**විජය ජයතිලක**
ජාතික සම්බන්ධීකාරක

## ඇතුළත

- ඉලක්ක ක්ෂේත්‍ර
- අත්දැකීම්
- ඉදිරි වැඩසටහන්
- ව්‍යාපෘති සංසිද්ධීන
- ධාරිතා වර්ධනය
- FLICT සිදුවීම්
- සම්පත් මූලාශ්‍රයන්
- වත්මන් හවුල්කරුවන්